Fact Sheet 1 - Sinhalese

තොරතුරු පත්‍රිකාව 1

# ගෘහස්ථ, පවුල් සහ ලිංගික හිංසනය හඳුනාගැනීම

කාන්තාවන් සහ ඔවුන්ගේ ළමුන්ට විවිධ ආකාරයේ හිංසන සහ අපයෝජ්‍ය චර්යා අත්දැකීමට පුළුවන. මෙම චර්යා ප්‍රධාන වශයෙන්ම පිරිමින් විසින් සිදුකරන බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි.

ගෘහස්ථ, පවුල් සහ ලිංගික හිංසනය [domestic, family and sexual violence (DFSV)] අත්විඳින පුද්ගලයන් සහ පවුල් සඵල ලෙස හඳුනාගැනීමට, උපකාර කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට ඔබ මෙය කුමක්ද සහ ඔබට උපකාර කළ හැක්කේ කෙසේද යන්න දැනගැනීම වැදගත්ය.

**ගෘහස්ථ, පවුල් සහ ලිංගික හිංසනය යනු කුමක්ද?**

ගෘහස්ථ සහ පවුල් හිංසනය යනු සහකාරයෙකු, හිටපු සහකාරයෙකු, සමහරවිට ගොදුරු වන තැනැත්තා සමග ඉතා සමීප පුද්ගලික සම්බන්ධතාවයක් තිබෙන කෙනෙකු හෝ ඇයගේ පවුලේ සාමාජිකයෙකු (පරම්පරා කීපයක් හරහාද ඇතුලුව) විසින් ගොදුරුවන්නා පාලනය කිරීමට හෝ බියගැන්වීමට සිදුකරන අපයෝජ්‍ය චර්යාවන්ය.

මෙය ශාරීරික චර්යා පමණක්ම නොවේ

ගෘහස්ථ හිංසනයට ඇතුලත් විය හැකි දේ:

- තුවාල සිදුකරන ශාරීරික හිංසන - පහරදීම, හපා කෑම, තල්ලු කිරීම, පයින් ගැසීම, හුස්ම හිර කිරීම
- ලිංගික හිංසනය - තව කෙනෙකුට ලිංගික ක්‍රියා සඳහා බල කිරීම. ස්ත්‍රී දූෂණය සහ ලිංගික අඩන්තේට්ටම් , ව්‍යභිචාරය සහ ළමා ලිංගික අපයෝජනය මීට ඇතුලත්ය
- චිත්තවේගී හෝ මානසික අපයෝජනය - බැන වැදීම හෝ සහකාරියක්ව ප්‍රසිද්ධියේ ලජ්ජාවට පත් කිරීම
- වාචික අපයෝජනය – කෑ ගැසීම, අසභ්‍ය වචන භාවිතය හෝ නොකඩවා සහකාරියව විවේචනය කිරීම
- සමාජ අපයෝජනය – යම් කෙනෙකුව තනි කිරීම සහ මිතුරන් සහ පවුලේ අය දැකීමෙන් වැළැක්වීම
- අධ්‍යාත්මික අපයෝජනය – අධ්‍යාත්මික හෝ ආගමික විශ්වාස හෝ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම හෝ යමෙකුව පාලනය කිරීමට හෝ ආධිපත්‍යයට යටත් කරගැනීමට එවා භාවිතා කිරීම
- දේපළ හානිය - පාලනය කිරීමට, බිය ගැන්වීමට, තර්ජනය හෝ අවමන් කිරීම පිනිස
- මූල්‍ය අපයෝජනය - මුදල් පාලනය කිරීම හෝ අත්‍යවශ්‍ය මුදල් ප්‍රතික්ෂේප කිරීම
- හිංසා කිරීමට තර්ජනය - සුරතල් සතුන් සහ ළමුන් ඇතුලුව
- පසු පස ලුහුබැඳීම - යමෙකුගේ කැමැත්තට එරෙහිව ලුහුබැඳීම (ශාරීරිකව හෝ මාර්ගගතව)
- සේවා ස්ථානයේදී සහ පොදු ස්ථාන වලදී ලිංගික අඩන්තේට්ටම සහ බියවැද්දීම
- කාංතා ප්‍රජනන ඉන්ද්‍රිය ඡේදනය
- බලහත්කාර විවාහ සහ ළමා විවාහ
- ඊනියා නම්බු අපරාධ (honour crimes) පවුලට අවනම්බු වෙන පරිදි ඇය ක්‍රියා කර ඇතැයි යන සංජානනය මත කාංතාවක් පාලනය කිරීමට හිංසනය සහ බියගැන්වීම.
- දැවැද්ද සම්බන්ධ අපයෝජනය තෑගි කළ දැවැද්ද අසතුටුදායකයයි මනාලයා සහ/හෝ ඔහුගේ පවුල විසින් සැළකීම. විවාහයට පෙර, අතරතුර හෝ පසුව අඩන්තේට්ටම් සහ වැඩිපුර දැවැද්දක් ලබා ගැනීමට හිංසා කිරීම. අන්ත අවස්ථා වලදී මෙය මරණයට පවා හේතු විය හැක.

## නීතිය යටතේ

ආරක්ෂිතව ජීවත් වීමටත් ගෞරවාන්විතව සලකනු ලැබීමටත් සෑම කෙනෙකුටම අයිතියක් ඇත. ඔස්ට්‍රේලියාවේ නීතිය පුරුෂයන් සහ ස්ත්‍රීන්ට සමානව සලකයි. DFSV පිලිගනු නොලබන අතර ඒ චර්යා නීතියට එරෙහි අපරාධයන් ය.

දකුණු ඔස්ට්‍රේලියාවේ නීතිය යටතේ DFSV අපරාධ සිදු කරන්නන්ට අඩන්තේට්ටම් හෝ ,තුවාල කර ඇත්නම්, හානි කිරීමේ චෝදනා ලැබිය හැක.

## යම් කෙනෙක් DFSV අත්දකිනවාද යන්න මම දැනගන්නේ කෙසේද?

DFSV ඊට ගොදුරුවුවන්ට, ඔවුන්ගේ දරුවන්ට සහ පවුලේ අයට හානිකරය. වයස, පංතිය, ලිංගික දිශානතිය, හැකියාව, ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම කුමක් වුවද DFSV ඕනෑම කෙනෙකුට සිදුවීමට පුළුවන.

කාන්තාවක් DFSV අත්දකින බවට සමහර ලකුණු:

- හදිසියේම, හේතුවක් නැතිව, එලියට යාම නැවැත්වීම
- තමන් යම් පුද්ගලයක්ව තරහ ගන්වන්නේ යයි කනස්සලු වීම
- යම් පුද්ගලයකු ගේ සෘනාත්මක හැසිරීම ගැන බොහෝ නිදහසට කරුණු පැවසීම
- හේතු දැක්විය නොහැකි ලකුණු හෝ තුවාල ඇයගේ ශරීරයේ තිබීම
- මිතුරන් සහ පවුලේ අය සමග කාලය ගෙවීම නවැත්වීම
- යම්කිසි පුද්ගලයෙක් ආසන්නයේදී බියක් හෝ සැකමුසු පරිස්සම් බවක් පෙන්වීම
- ඔවුන්ව අධීක්ෂණයට ලක්ව ඇතැයි, ලුහු බදිනු ලබයි හෝ යම් ආකාරයක පාලනයකට යටත්ව ඇතැයි කනගාටු වීම.

## හිංසාකාරී හෝ අපයෝජ්‍ය චර්යා වල ලකුණු මොනවාද?

හිංසනය හෝ අපයෝජනයේ යෙදෙන්නා පහත ආකාරයට හැසිරීමට ඉඩ ඇත:

- ඔවුන්ගේ බිරිඳ/පෙම්වතිය/සහකරු බියගන්වන සුළු ආකාරයට හැසිරීම
- ඔවුන්ගේ බිරිඳ/පෙම්වතිය/සහකරු සෑමවිටම අවමානයට ලක් කිරීම
- ඔවුන්ගේ බිරිඳ/පෙම්වතිය/සහකරුට හානි පමුනුවන බවට තර්ජනය කිරීම
- ඔවුන්ගේ බිරිඳ/පෙම්වතිය/සහකරු පාලනය කිරීම (පහත දේ ඇතුලුව) ඃ
  - ඔවුන් යන තැන්.
  - ඔවුන් හමුවන අය සහ ඔවුන් කතා කරන අය
  - ඔවුන්ගේ මුදල් පාලනය
  - ඔවුන් කෙසේ, කිනම් විට තම දුරකථනය, මෝටර් රිය හෝ පරිගනකය පාවිච්චි කරන්නනේද යන්න
  - ඔවුන් හැසිරන අන්දම පාලනය කිරීමට නීති රාශියක් පැනවීම
  - ඔවුන් පනවන ලද නීති ඇය විසින් අනුගමනය නොකරයයි නම් තරහ ගැනීම.

## ඊලග පියවර ගැනීම

DFSV කිසිම ප්‍රජාවක හෝ සංස්කෘතියක පිලිගත නොහැක. DFSV වැළැක්වීමට සහ කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීමට ඔබට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකිය.

යම් කෙනෙක් DFSV අත්විඳින්නේද යන්න සොයාගැනීම සඳහා ඔවුන්ට ඇහුම්කන් දීමට සහ උපකාර කිරීමට සැරසී සිටින්න.

වැඩිදුර තොරතුරු සඳහා
1800RESPECT (1800 737 732)
හෝ www.1800RESPECT.org.au

**හදිසි අනතුරකදී හෝ යම් කෙනෙක් අවදානමකට පත්ව සිටිනම් වහාම 000 අමතන්න.**

මෙය DFSV පිළිබඳ තොරතුරු පත්‍රිකා 4කින් එකක.. DFSV අත්විඳින කෙනෙකුට ඔබට උපකාර කළ හැක්කේ කෙසේද යන්න ගැන වැඩි තොරතුරු තොරතුරු පත්‍රිකා අංක2 හි අඩංගු වේ. ස්ත්‍රී පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය ගැන සොයාගැනීමට තොරතුරු පත්‍රිකා අංක 3 සහ අංක 4 බලන්න.